ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා

සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

3.1.1 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

2015 ජූනි 22 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකතනය සහ ඇස්තමේන්තු සකස් කිරීම විධිමත් පරිදි සිදු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**ආදායම් සංකේතාංකය 20:02:03:00 - ලාභ**		
(i)	2024 වර්ෂය සඳහා ලාභ ආදායම් සංකේතාංක 20.02.03.00 වෙනුවෙන් ඇස්තමේන්තුගත ආදායම රු.64,192,000,000 ක් වූ අතර තත්‍ය ආදායම රු.33,190,901,922 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 51 ක් පමණක් වී තිබුණි.	එකඟ වෙමි.	ආදායම් රැස් කර ගැනීමට තිබෙන ආයතන පිළිබඳව වඩාත් නිවැරදිව පුරෝකථනය කර වඩාත් නිවැරදි ආදායම් ඇස්තමේන්තු සකස් කළ යුතු වීම.
(ii)	සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 18 ක් මගින් රු.මිලියන 16,518 ක ආදායමක් අයකර ගැනීමට ඇස්තමේන්තු කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී එම ආයතන මඟින් කිසිදු ආදායමක් රැස් කරගෙන නොතිබුණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 11 කට අදාලව ලාභ ආදායම් ඇස්තමේන්තුකර නොතිබුණත්, එම ව්‍යවසායන්ගෙන් රු.මිලියන 2,952.5 ක ලාභ ආදායමක් ලැබී තිබුණි.	එකඟ වෙමි.	-එම-

(iii)	ලාභ ආදායම් සංකේතාංක 20.02.03.00 ට අදාලව රාජ්‍ය ව්‍යවසායන් 08 ක ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 13 ත් 94 ත් අතර පරාසයක පැවතුණි. එසේම, සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය ව්‍යවසායන් 10 කින් ඇස්තමේන්තු කරන ලද ලාභ ආදායමට වඩා වැඩියෙන් සියයට 46 ක සිට 1,900 දක්වා පරාසයක ලාභ ප්‍රමාණයකින් ආදායමට දායක වී තිබුණි.	එකඟ වෙමි.	නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම්ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස්කර ගැනීම වාර්තා තබා ගැනීම විධිමත් කළ යුතු වීම.
(ආ)	**ආදායම් සංකේතාංකය 20:02:04:00 - ලාභාංශ ආදායම**		
(i)	2024 වර්ෂයේ ආදායම් සංකේතාංක 20.02.04.00 - ලාභාංශ ආදායම් සඳහා ඇස්තමේන්තුගත ආදායම රු.5,341,000,000 ක් වූ අතර තත්‍ය ආදායම රු.7,889,520,000 ක් වීම හේතුවෙන් එය ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රු.2,548,520,000 ක් රැස් කරගෙන තිබුණි. ඒ අනුව, එය ඇස්තමේන්තුගත ආදායමට වඩා සියයට 48 ක වැඩිවීමකි.	එකඟ වෙමි.	නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහාත්, අයවැය පරතරය කෙතරම්ද යන්න තීරණය කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු හා ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ආදායම් පුරෝකථනය හා ආදායම් රැස්කර ගැනීම වාර්තා තබා ගැනීම විධිමත් කළ යුතු වීම.
(ii)	රාජ්‍ය ව්‍යවසායන් 16 කින් රු.මිලියන 1,140 ක ලාභාංශ ආදායමක් ඇස්තමේන්තුකර තිබුණද, එම ආයතන වලින් සමාලෝචිත වර්ෂය තුළදී ලාභාංශ ආදායමට කිසිඳු දායකත්වයක් ලබා දී නොතිබුණි. එසේම, 2024 වර්ෂයේ ඇස්තමේන්තුගත ලාභාංශ ආදායමට ඇතුලත් නොකරන ලද රාජ්‍ය ව්‍යවසායන් 6 ක්, සමාලෝචිත වර්ෂය තුළදී ලාභාංශ ආදායමට රු.මිලියන 3,368 කින් දායක වී තිබුණි.	එකඟ වෙමි.	-එම-
(iii)	රාජ්‍ය ව්‍යවසායන් 07 ක ලාභාංශ ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 3 ත් 92 ත් අතර පරාසයක පැවතුණි. තවද, රාජ්‍ය ව්‍යවසායන් 10 කින් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ලාභාංශ ආදායම ඉක්මවා සියයට 24 ක සිට සියයට 900 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභාංශ ආදායමට දායක වී තිබුණි.	එකඟ වෙමි.	-එම-

(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබූ රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 5.3 ඡේදය ප්‍රකාරව, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද නුබුන්වත් බව සහතික කරන රාජ්‍ය සමාගම්වල බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට ගෙන්වා ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය සමාගම් 11 කට අදාළව 2023 වර්ෂයේ ලාභාංශවලින් එකතුව රු.මිලියන 13,010 ක් වූ ලාභාංශ ආදායමක් එකතු කරගෙන නොතිබුණි.	එකඟ වෙමි.	රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 5.3 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මූලික වියදම් ඇස්තමේන්තුව හා සංශෝධිත වියදම් ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී වැය විෂයන් 12කට අදාළව විචලතාවය සියයට 83ක අඩුවීමේ සිට සියයට 100ක වැඩිවීම දක්වා පරාසයක් තුළ වෙනස් වී තිබුණි.	එකඟ වෙමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම.
(ආ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයන් 15ක් සහ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කල පසු රු.272,470,396,376 ක ඉතිරියක් පැවති අතර, එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 79 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.	එකඟ වෙමි.	-එම-
(ඇ) 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව, අරපිරිමැසුම්දායි ලෙස රජයේ වියදම් දැරීමක්, වියදම් අවම කිරීම සඳහා වන රෙගුලාසි හා චක්‍රලේඛ දැඩිව	එකඟ වෙමි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

පිළිපැදීමක් මගින් වියදම් පාලනය සඳහා වන ක්‍රියාමාර්ග භාවිත කළ යුතු බව දන්වා තිබූ අතර වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව තුල පමණක් වියදම් දැරීම සඳහා බැඳීම් ඇතිකර ගත යුතු බව දන්වා තිබුණි. කෙසේ වුවද, වැය ශීර්ෂය 1508 (වෙනත්) සඳහා 2024 දෙසැම්බර් 11 දින පරිපූරක ඇස්තමේන්තුව මගින් රු.130,000,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන සම්පූර්ණ වශයෙන් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව, රු.8,081,294,498 ක් එනම්, සංශෝධිත ඇස්තමේන්තුවෙන් සියයට 6 ක ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි.		
(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට මුදල් රෙගුලාසි 66 යටතේ වැය ශීර්ෂයන් 02ක් සඳහා සිදු කරන ලද ප්‍රතිපාදන මාරු කිරීම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණ වශයෙන් උපයෝජනය නොකර ඉතිරි වී තිබුණි.	එකඟ වෙමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම.

3.3 බැඳීම් හා බැරකම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ මිලදී ගෙන තිබූ වාහන 3ක් සඳහා 2024 දෙසැම්බර් මාසය වෙනුවෙන් ගෙවීමට නියමිතව තිබූ කුලී එකතුව රු.969,291 ක් 2024 වර්ෂයේ බැරකම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර, 2025 ජනවාරි මාසය තුළදී පියවා තිබුණි.	එකඟ වෙමි. අතපසුවීමකින් මෙම මුදල බැරකම් ලේඛනයට ඇතුළත් කර නොතිබූ අතර, මින් ඉදිරියට එවැනි අතපසුවීම් වළක්වා ගන්නා ලෙසට විෂය නිලධාරියා වෙත උපදෙස් ලබා දෙන ලදී.	මු.රෙ. 94(1) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

3.4 පොදු තැන්පත්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 ජූලි හා සැප්තැම්බර් මාසවල පොදු තැන්පත් ලේඛනයේ ලැබීම්වල මුළු එකතුව පිළිවෙලින් රු.2,600 ක් හා රු.3,782,024 ක් ලෙස සටහන් කර තිබුණි. කෙසේ වුවද, අදාල භාණ්ඩාගාර මුද්‍රිතවල එය පිළිවෙලින් රු.3,200ක් හා රු.2,519,216 ක් ලෙස සටහන් කර තිබුණි.	එකඟ වෙමි.	ගිණුම්ගත කිරීම්වලදී නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතු වීම.

4. මෙහෙයුම් සමාලෝචනය

රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව රාජ්‍ය ව්‍යවසායන්හි කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා කළමනාකරණයට උපදෙස් ලබා දීම හා අධීක්ෂණය කිරීමත්, ඒවායෙහි සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාවය සහ ආර්ථිකභාවය සහතික කරමින් අරමුණු කරා මෙහෙයවීමත්, එකී ආයතනවල යහපාලනය වැඩිදියුණු කිරීමත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරයක් වී තිබුණ ද එම කාර්යභාරය ඉටු කිරීමට දෙපාර්තමේන්තුව විසින් සාධනීය ලෙස මැදිහත්වී නොමැති අවස්ථා නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මහා භාණ්ඩාගාරය විසින් 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන් 6 ක් වෙනුවෙන් රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාග්ධන දායකත්වය ලෙස එකතුව රු.මිලියන 218,245 ක් සපයා තිබුණි. එම ආයෝජනයේ වටිනාකම 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 204,367 ක් වූ අතර, එක් එක් ආයතන වල මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ඒවායේ මුළු ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) වල වටිනාකම සෘන රු.මිලියන 412,450 ක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධන දායකත්වය වත්කමක් ලෙස දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ වශයෙන් හානිකරණය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය.	අලාභ ලබන ලද ව්‍යවසායන්හි අලාභය අඩු කර ගැනීම සඳහා සහ ලාභ ලැබීමේ තත්වයට ගෙන ඒම සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇත.	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතනයන්හී මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර ඒවායේ ආයෝජන වටිනාකම්හි අඩු වීම් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිසි පරිදි අනාවරණය කිරීමට අදාළ දෙපාර්තමේන්තු වෙත සන්නිවේදනය කිරීම.
(ආ)	සමාලෝචිත වර්ෂය ආරම්භක හා අවසාන දිනට එකතුව රු.මිලියන 1,935,429 ක රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05 ක 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් එකතුව රු.මිලියන 550,744 ක් පමණක් විය. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් වල කර ඇති ආයෝජනය සැලකියයුතු ලෙස හානිකරණයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.	අලාභ ලබන ලද ව්‍යවසායන්හි අලාභය අඩු කර ගැනීම සඳහා සහ ලාභ ලැබීමේ තත්වයට ගෙන ඒම සඳහා ව්‍යාපාර සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇත.	-එම-

(ඇ) නියැදි පරීක්ෂාවන් අනුව, රජය සතු සංස්ථා 04 ක් 2022 වර්ෂයට අදාළව එකතුව රු.මිලියන 291 ක ලාභයක් වාර්තා කර තිබුණද, 2023 වර්ෂයේදී එකතුව රු.මිලියන 3,199 ක අලාභයක් වාර්තා කර තිබූ බව නිරීක්ෂණය විය.	විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති විශේෂයෙන් මිල ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම, පුද්ගලික අංශය හා තරඟ කිරීමට අවශ්‍ය වන ව්‍යුහාත්මක වෙනස්කම් කිරීමට අවශ්‍ය රාජ්‍ය මූල්‍යනය ප්‍රමාණවත් නොවීම තුල මූල්‍ය වෙළඳපලින් ලබාගත් ණය සඳහා ගෙවීමට සිදුවන අධික මූල්‍ය පිරිවැය වැනි කාරණා නිසා සමස්තයක් ලෙස අලාභයන් වාර්තා වී ඇති නමුත්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යවසායන් වෙත ලබා දෙන උපදේශනාත්මක සහාය මත සිදු කරනු ලබන විවිධ ප්‍රවර්ධනාත්මක වෙනස්කම් තුළින් ලාභදායීත්වයක් බොහෝ රාජ්‍ය ව්‍යවසායන් තුළින් ඉදිරියේදී අපේක්ෂා කෙරේ.	අලාභයන් ලබන රාජ්‍ය ව්‍යවසායන් ලාභ ලැබීමේ තත්ත්වයට ගෙන ඒම සඳහා අධීක්ෂණ කටයුතු කිරීමේදී විශේෂ අවධානය යොමු කළ යුතු වීම.
(ඈ) නියැදි පරීක්ෂාවන් අනුව, 2022 වර්ෂයේදී අලාභයන් වාර්තා කර තිබූ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව 2023 වර්ෂයේදී ද අලාභයන් වාර්තා කර තිබූ අතර, ඒ අතුරින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අලාභයන් පිළිවෙලින් සියයට 358 ක් හා 161 කින් ඉහළ ගොස් තිබුණි.	-එම-	-එම-
(ඉ) නියැදි පරීක්ෂාවන් අනුව, 2022 වර්ෂයේදී රු. මිලියන 133 ක ශුද්ධ ලාභයක් වාර්තා කර තිබූ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 2023 වර්ෂයේදී රු. මිලියන 168 ක ශුද්ධ අලාභයක්ද, 2022 වර්ෂයේදී රු.මිලියන 5 ක ශුද්ධ අලාභයක් වාර්තා කර තිබූ ජනතා වතු සංවර්ධන මණ්ඩලය 2023 වර්ෂයේ දී රු. මිලියන 156 ක ශුද්ධ	-එම-	-එම-

	අලාභයක්ද වාර්තා කර තිබූ අතර, පසුගිය වර්ෂයට සාපේක්ෂව එම අලාභය සියයට 2,799 කින් වැඩි වී තිබුණි.		
(ඊ)	2023 වර්ෂය අවසාන වන විට රාජ්‍ය ව්‍යවසායන් 08 කට අදාළව ජංගම අනුපාත දුර්වල තත්ත්වයක පැවතුණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සහ ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවේ ජංගම අනුපාතය පිළිවෙලින් 0.15 ක් හා 0.17 ක් වැනි ඉතාමත් පහළ අගයක පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් ද්‍රවශීලතා දුෂ්කරතාවයන්ට මුහුණදීමේ ඉහළ අවධානමක් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	මේ සඳහා එක් එක් රාජ්‍ය ව්‍යවසායන්ට අදාළව හේතු වී ඇති කරුණු දන්වා තිබුණි.	අදාළ ව්‍යවසායන්හි අධීක්ෂණ කටයුතු කිරීමේදී ද්‍රවශීලතා දුෂ්කරතාවයන් මඟහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම.
(උ)	2023 වර්ෂය අවසාන වන විට රාජ්‍ය ව්‍යවසායන් 16 ක් සම්බන්ධයෙන් අධි ප්‍රාග්ධන තෝලන තත්ත්වයක් නිරීක්ෂණය විය. තවද, මුළු හිමිකාරීත්වය ඍණ අගයක් ගෙන ඇති රාජ්‍ය ව්‍යවසායන්ද නිරීක්ෂණය වූ අතර එම ආයතන මුළුමනින්ම දිගුකාලීන ණය මඟින් මූල්‍යනය කර තිබුණි. ඒ අනුව, මෙම සියළු ආයතන ඉහළ මූල්‍ය අවධානමකට (Financial Risk) මෙන්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානමකට මුහුණ දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.	මේ සඳහා එක් එක් රාජ්‍ය ව්‍යවසායන්ට අදාළව හේතු වී ඇති කරුණු දන්වා තිබුණි.	අදාළ ව්‍යවසායන්හි අධීක්ෂණ කටයුතු කිරීමේදී තෝලන තත්ත්ව ප්‍රශස්තව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම.
(ඌ)	රාජ්‍ය ව්‍යවසායන් 21 කට අදාළව විගණනය වෙත ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව, ප්‍රාග්ධන දායකත්වය සහ 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රජයේ ප්‍රාග්ධන දායකත්වය අතර රු.මිලියන 25,898 ක වෙනසක් නිරීක්ෂණය විය.	එකඟ වෙමි.	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ඇගයීමට ලක් කර නිසි ක්‍රියාමාර්ග ගැනීමට හා ගිණුම්වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම.

(එ)	2024 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල සෘජු ශේෂ සනාථ කිරීම් සහ රජයේ මූල්‍ය ප්‍රකාශන අතර ආයතන 5 කට අදාළව රජයට අයත් කොටස් සංඛ්‍යාවෙහි වෙනස්කම් නිරීක්ෂණය වූ අතර රජයේ මූල්‍ය ප්‍රකාශන තුල එදිනට රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.476,986 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	එකඟ වෙමි.	-එම-
(ඒ)	Sri Lanka Institute of Biotechnology (Pvt) Ltd ආයතනයෙන් ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2024 දෙසැම්බර් 31 දිනට කොටසක මිල රු.10 ක් වූ කොටස් 52,472,574 ක් මහා භාණ්ඩාගාරය සතු බව සඳහන් කර තිබූ අතර, 2024 දෙසැම්බර් 31 දිනට මුළු ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 525 ක් විය. කෙසේ වුවද, 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව මෙම අගයට අමතරව රු.මිලියන 772 ක ප්‍රාග්ධන දායකත්ව ශේෂයක් පැවතුණි.	එකඟ වෙමි.	-එම-
(ඔ)	රාජ්‍ය ව්‍යවසායන් 08 කට අදාළව 2024 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 1,150,312 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 1,167,570 ක් වීම හේතුවෙන් ඒ අතර රු.මිලියන 17,258 ක වෙනසක් නිරීක්ෂණය විය.	එකඟ වෙමි.	-එම-
(ඕ)	රාජ්‍ය සමාගම් 06 කට අදාළ හිමිකාරිත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නිකුත් කළ අගය අනුව ගණනය කිරීමේදී 2024 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 6,549 ක් වුවද, එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 15,893 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2024 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 9,344 ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම වෙනස්කම් වලට බලපාන්නාවූ හේතු වැඩිදුරටත් සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	-එම-

(ක) රාජ්‍ය ව්‍යවසායන් 09 කට අදාළව ඉදිරිපත් කළ ඍජු ශේෂ සනාථ කිරීම් අනුව හා රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම රාජ්‍ය ව්‍යවසායන් වලට අදාළව මහා භාණ්ඩාගාරයට අයත් කොටස් හිමිකාරිත්වයේ ප්‍රතිශතයන් හි වෙනස්කම් නිරීක්ෂණය විය.	ඉදිරියේ දී ඒ පිළිබඳවද වැඩි අවධානයක් යොමු කර අදාල සමාගම්වල සහයෝගීතාවය ද ලබා ගනිමින් කොටස් සංඛ්‍යාවේ ප්‍රතිශතයේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම් වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වීම.
(ග) "මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම" යන ප්‍රධාන කාර්යය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ආයතනවල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් විය. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ආයතන 305 ක් පැවතිය ද, දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ඉදිරිපත් කර තිබුණේ දෙපාර්තමේන්තුව ක්‍රමෝපායිකව වැදගත් ලෙස සලකන ලද ආයතන 52කට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අදාළ තොරතුරු පමණි. ඒ පිළිබඳ තවත් නිරීක්ෂණ පහත දැක්වේ.		
(i) 2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද Operational Manual for State Owned Enterprises මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6 පරිච්ඡේදය පරිදි, මූල්‍ය වර්ෂයට අදාළ වාර්ෂික වාර්තා වර්ෂය අවසන් වී මාස 05 ක් ඇතුළත විගණන වාර්තාව සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, විගණිත දිනය වූ 2025 මැයි 21 දින වන විට 2023 වර්ෂය වෙනුවෙන් එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ ඇතුළත් කර තිබුණේ ආයතන 05 කට අදාළ වාර්ෂික	වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු සභාගත කිරීම පිළිබඳව මෙම වර්ෂය ආරම්භයේ දී අදාළ ආයතන වල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්, ආයතන ප්‍රධානීන් හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම සිදු කර ඇත. මේ පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ ආයතන වෙත විටින් විට දැනුවත් කිරීම් සිදු කර ඇත.	අධීක්ෂණයට ලක්වන සියළුම ආයතන සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම හා තොරතුරු පසුවිපරම් කළ යුතු වීම.

	වාර්තා පමණි. 2024 වර්ෂය වෙනුවෙන් 2025 මැයි 30 දින දක්වා කිසිඳු ආයතනයකට අදාළ වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ ඇතුළත් කර නොතිබුණි.		
(ii)	2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 පරිච්ඡේදය පරිදි, වාර්ෂික කාර්යය සාධන ඇගයීම් රැස්වීමේ දී වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ද ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ද ඉතා පහල මට්ටමක පැවතුණු බව නිරීක්ෂණය විය.	මේ සම්බන්ධයෙන් අදාළ දැනුවත් කිරීම් නිරන්තරයෙන් මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. එහෙත් වාර්ෂික කාර්යසාධන ඇගයීම් රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් අදාළ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දැරිය යුතුය.	ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.